12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date. 2023/06/08 |

පැමිණිලි පාර්ශවය : එස්.එම් සුමතිපාල මයා,
අංක : 147/5, හිඟුරුගමුව,
බදුල්ල.

වගඋත්තර පාර්ශවය : ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බදුල්ල.

**පැමිණිලි අංකය :- HRC/BD/57/20**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2020.05.27 වන දින කොරෝනා වසංගත තත්ත්වය මත පීඩාවට පත් ජන කොටස් සඳහා රජයෙන් ලබා දුන් රුපියල් 5000.00 ක දීමනාව අවස්ථා දෙකක දී තමා වෙත ලබා නොදුන් බවයි. තමා අවුරුදු 70 ක් ඉක්මවූ කිසිදු විශ්‍රාම වැටුපකට හෝ ආදායම් මාර්ගයකට හිමිකම් නොකියන ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු බවත්, කලාකරුවෙකු වන තමා අවුරුදු 65ක් බිරිඳ සමඟ ඉහත ලිපිනයෙහි පදිංචි වී සිටින බවත්, බොහෝ කලක සිට කලාකරු දීමනාව ලැබූ පුද්ගලයෙකු බවත්, සෑම වසරකම රුපියල් 10000.00 ක මුදලක් බා ගත් බවත් ප්‍රකාශ කර ඇත.

මෙම පන්දහසේ දීමනාව ලබා ගැනීමට ග්‍රාම නිලධාරීතුමා මුණ ගැසුණු අවස්ථාවේදී කලාකරු දීමනාව ලබන නිසා එම දීමනාව ලබා ගත නොහැකි බව ප්‍රකාශ කරන ලද බවත්, ඉන් පසු 2020.04.18 වන දින සහකාර ප්‍රාදේශය ලේකම් වෙත මෙම සිදුවූ අසාධාරණය පිළිබඳ සඳහන් කළද, 2020.04.22 දින දක්වා කිසිදු විසඳුමක් ලබා නොදුන් බැවින්, නැවතත් එතුමිය හමු වී ඒ පිළිබඳ සඳහන් කළ බවද ප්‍රකාශ කර ඇත. ඉන් අනතුරුව එය තමා වෙත ලබා දිය නොහැකි නම් ඒ පිළිබඳව ලිඛිතව දන්වන ලෙස පැවසූ අවස්ථාවේදී ඒ පිළිබඳව සඳහන් කර ලිපියක් නිවසටම ලබා දෙන බව පවසන ලද බවත් දක්වා ඇත.

නමුදු එවැනි ලිපියක් 2020.04.30 වන දින දක්වාම නොලැබුණු බවත්, නැවතත් ප්‍රාදේශීය ලේකම්තුමිය හමු වූ අවස්ථාවේදී පැයක් පමණ කාර්යාලයේ රඳවා ගැනීමෙන් පසු නිවසටම ලිපියක් ලබා දෙන බවට

පැවසූ බවත්, එදිනම ලේකම්තුමියට ලියාපදිංචි තැපෑලෙන් නැවතත් ලිපියක් යොමුකළ බවත්, 2020.05.13 වන දින තොරතුරු ලබාගත් බවත්, 2020.05.14 දින සිදු වූ අසාධාරණය පිළිබඳ දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් ප්‍රාදේශිය ලේකම්තුමා ( බදුල්ල ) වෙත එම ගෙවීම් සිදු කළ හැකිද යන්න සොයා බලා කටයුතු කරන ලෙස දන්වා ඇති බවත්, 2020.05.27 දින තොරතුරු ලබා දී ඇති බවත්, පැමිණිලිකරු පවසා ඇත. තවදුරටත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, කලාකරු දීමනාව ලබාදෙන නිසා තමාට එම දීමනාව ලබානොදුන්නද, හාලිඇල ප්‍රදේශයේ ලේකම් කාර්යාලය මඟින් කලාකරුවන්ටද රුපියල් 5000.00 දීමනාව ලබා දී ඇති බව තමා දන්නා බවයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම ගැටළුව සම්බන්ධයෙන් විත්තිකාර පාර්ශවය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම්, බදුල්ල මඟින් වාර්තාවක් ඉල්ලා සිටි බැවින් , එම වාර්තාවට අනුව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත්තේ, " 01. බදුල්ල , හිඟුරුගමුව , 147/05 ලිපිනයෙහි පදිංචි එස්. එම් සුමතිපාල මහතා මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අගහිග කලාකරු ආධාර ලාභියෙකු වශයෙන් ලියාපදිංචි අයෙක් බවත්, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂකගේ අංක 04/2017 හා 2017.06.19 දිනැති චක්‍රලේඛනය අනුව රජයේ විශ්‍රාම වැටුපක් හෝ රජයේ ලබා දෙන වෙනත් කිසිදු ආධාරයක් (ආබාධිත තැනැත්තන් සඳහා වන කාර්යාංශයෙන් ආධාර මුදලක් නොලබන හෝ සමෘද්ධි අමාත්‍යාංශයෙන් ලබා දෙන සමෘද්ධි ආධාර නොලබන කලාකරුවන් ) නොලබන කලාකරුවන් හට පමණක් අගහිග කලාකරු ආධාර ගෙවනු ලබන බවයි ". සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් එවන ලද කෙටි පණිවිඩය මඟින් කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා අගහිග කලාකරු ආධාර ගෙවීම් කරන ලෙස ලබාදුන් උපදෙස් අනුව 2020.04.02 දින මෙම අය වෙත රුපියල් 10,000.00 ක අගහිග කලාකරු ආධාර ගෙවීම් කර ඇති බවත්, කලාකරු ආධාර ලාභීන් කොරෝනා වසංගතය හේතුවෙන් ලබාදෙන රුපියල් 5000.00 දීමනාවට ඇතුළත් කර නොගන්නා ලෙසට බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක බීඩී/10/3/8 හා 2020.04.20 දිනැති ලිපිය මඟින් උපදෙස් දී ඇති බවත් දක්වා ඇත. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ එස්.එච් සුමතිපාල මහතාද ඇතුළත්ව අගහිග කලාකරු ආධාරලාභීන් 143 දෙනෙකු කොරෝනා ආධාර ගෙවීමෙන් ඉවත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලැබී ඇති බවත්, එස්.එච්. සුමතිපාල මහතා ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව සඳහා සුදුසුකම් ලබන වයස අවුරුදු 70ට එළඹෙනුයේ 2020.03.21 බවත්, ඔහු විසින් වැඩිහිටි දීමනා අයදුම්පතය මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කරනුයේ 2020.06.17 වන දින බැවින් මෙම අය ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා ලේඛනයට හෝ පොරොත්තු ලේඛනයට ඇතුළත් නොවන බවත් දක්වා ඇත.

අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PTF/03-2020 අනුව ප්‍රාදේශීය ලේකම් සතුව ඇති පොරොත්තු ලේඛණ සඳහා ග්‍රාමීය කමිටු අනුමැතිය ලබා ගතයුතු වූ අතර වැඩිහිටි ජීවනාධාරලාභී ලේඛණ වල හා පොරොත්තු ලේඛණ වල නම සඳහන් නොවූ වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන් වෙත රු5000/= ජීවනාධාර ගෙවීම සඳහා ඔවුන්ගේ නාම ලේඛණය ග්‍රාමීය කමිටුවෙහි අනුමැතිය සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු

කරවන ලෙස අදාළ ග්‍රාමීය කමිටු වෙත උපදෙස් ලබා දී ඇති බවත් දක්වා ඇත. මෙම වසමේ ග්‍රාමීය කමිටුවේ සංයුතිය පිළිබඳ සලකා බැලීමේදී රජයේ නිලධාරීන් 04 දෙනා හැර ඉතිරි 11 දෙනෙකු ප්‍රාදේශීය දේශපාලන නායකයින් හා ස්වෙච්ඡා සංවිධාන නියොජිතයින් වන බවත් ඒ අනුව මෙම අයගේ නම එකී ග්‍රාමීය කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, කොරෝනා තත්ත්වය මත අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සාමාන්‍ය පරිදිම ක්‍රියාත්මක නොවීම නිසා සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් කොරෝනා තත්ත්වය හේතුවෙන් ප්‍රමුඛ කාර්යයක් සේ සලකා අගහිග කලාකරු ආධාර අප්‍රේල් මාසයේදී ගෙවන ලෙස සංස්කෘතික නිලධාරීන් වෙත දූරකථන කෙටි පණිවිඩ මඟින් උපදෙස් ලබා දී ඇති බවත් දක්වා ඇත.

ඒ අනුව 2020.04.02 වන දින ගෙවීම් කටයුතු සිදු කර ඇති බවත්, අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PTF/03-2020 (ii) සහ 2020.04.15 දිනැති චක්‍රලේඛය අනුව ග්‍රාමීය කමිටුව මඟින් ප්‍රතිලාභීන් වශයෙන් ප්‍රතික්ෂේප වූවන්ගේ නාමලේඛනය , එහි සඳහන් ආකෘතිය අනුව සකස් කර ග්‍රාමීය කමිටුවේ නිර්දේශය සමඟ ග්‍රාම නිලධාරී , සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් තබා ගන්නා ලෙසට උපදෙස් දී ඇති බවත්, දක්වා ඇත.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හා ආබාධිත මහ ලේකම් කාර්යාලය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් චක්‍රලේඛ නිකුත් කර ඇති අතර, ඒ සම්බන්ධව වැඩිදුරටත් දිස්ත්‍රික් ලේකම්වරු වීඩියෝ තාක්ෂණය ඔස්සේ අවස්ථානුකූලව රැස්වීම් පවත්වා ලබා දෙනු ලැබූ උපදෙස් ක්‍රියාත්මක කරන ලද බවත්, දිමනා නොලැබීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් වූ සියලු අභියාචනා නැවත ග්‍රාමීය කමිටුවේ නිර්දේශය ලබා ගැනීම සඳහා යොමු කරන ලද අතර, එස්.එච් සුමතිපාල මහතා විසින් 2020.04.18 දිනැතිව එවන ලද අභියාචනය ග්‍රාමීය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද බවත් එම අභියාචනයද ග්‍රාමීය කමිටුව විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අප්‍රේල් මස මෙම අය වෙත ගෙවීම් කර ඇති බවත් දක්වා ඇත.

කොරෝනා වසංගත කාලයේදී කාර්යාල වල නිලධාරීන් සීමිත ප්‍රමාණයක් රාජකාරියට වාර්තා කිරීම, අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා බලපත්‍ර නිකුත් කිරීම, වියළි සලාක බෙදා දීමේ කටයුතු යනාදී විවිධ රාජකාරී කටයුතු බහුල වීම හේතුවෙන් අභියාචනය ප්‍රතික්ෂේප වීම පිළිබඳව අදාල පුද්ගලයින් වෙන් වෙන්ව ලිඛිතව දැනුවත් කිරීමේ හැකියාවක් නොමැති වූ බැවින් වාචිකව අළ පුද්ගලයින් දැනුවත් කර ඇති බවත්, නමුත් එස්.එච්. සුමතිපාල මහතා විසින් තොරතුරු දැන ගැනීමේ පනත යටතේ 2020.05.13 දිනැතිව ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයට අදාළ කොරෝනා වසංගතය හේතුවෙන් සමාජ ප්‍රතිලාභ ගෙවීමට අදාළ චක්‍රලේඛ පිටපත් 2020.05.21 දිනැතිව ලබා දී ඇති බවත්, 2020.05.22 දිනැතිව ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලුම්පත්‍රය මඟින් එකී චක්‍රලේඛ ඉල්ලා ඇති අතර, කාර්යාලයේ සිදුවූ අතපසු වීමකින් 2020.07.08 දිනැතිව තොරතුරු ලබා දී ඇති බවත්, දක්වා ඇත.

මැයි මස දෙවන වටයේ කොරෝනා ආධාර ගෙවීම් සිදු කිරීමේදී ග්‍රාමීය කමිටුවක් නොතිබු බැවින් සමෘද්ධි සංවර්ධන නිලධාරී හා සංවර්ධන නිලධාරීන් පමණක් එක්ව ජීවනෝපාය අහිමිවූවන් වෙත රු5000 දීමනා ගෙවීම් කටයුතු කරන ලද බවත් එහිදී වැරදීමකින් මෙම අය වෙත රු5000 ගෙවීම් කර තිබු හෙයින්, එය නැවතත් අය කර ගැනීමට කටයුතු කරන ලෙස තමාගේ අංක BD/BD/SMD/4/74 හා 2020.06.24 දිනැති ලිපිය මගින් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත උපදෙස් දී ඇති බවත් දක්වා ඇත.

තවද ග්‍රාම නිලධාරී සහ සමාජ සේවා නිලධාරී විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාව අනුව ඉල්ලුම්කරුගේ දරුවන් දෙදෙනෙකු රාජ්‍ය අංශයේ රැකියා වල නිරත වන බවත් පවුලේ ආර්ථික තත්ත්වය පවුල් පරිසරය අනුව මෙම අයට ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ගෙවීමට නිර්දේශ කළ නොහැකි බව වාර්තා කර ඇති බවත්, ඒ අනුව මේ වන විට රු 5000 ගෙවීම් සිදු කර ගිණුම් පියවීමේ කටයුතු ද අවසන් කර ඇති බැවින් එස්.එම් සුමතිපාල මහතා වෙත රු 5000 දීමනාව ගෙවීමට හැකියාවක් නොමැති බවද දක්වා ඇත.

පැමිණිල්ලේ විරෝධතා :-

පැමිණිලි පාර්ශවය විරෝධතා ගොනු කරමින් කොරෝනා තත්තවය මත තමා හට හිමිව තිබූ රජයෙන් ලබා දුන් රු 5000 මුදලේ වාරික දෙකකින් එකක් ලබා නොදීම පිළිබඳව මා විසින් මෙම ලිඛිත කරුණු දැක්වීම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා පුරවැසියෙකු වශයෙන් තම අයිතීන් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේදි රාජ්‍ය නිලධාරීන් අතින් සිදුවන වැරදි පරිපාලන ක්‍රියාවන් නිවැරදි කරලීම මගින් පුද්ගලයාට ලැබිය යුතු අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා වන බවත්, බහුතරයක් රාජ්‍ය නිලධාරීන්ගේ හැඟීම වන්නේ ඔවුන් අතින් සිදු කරනු ලබන පරිපාලන වැරදි තමා වැනි සාමාන්‍ය මිනිසුන් විසින් ඔවුන්ගේ උස්හඩට බිය වී යටපත් කර නිහඩව ඉවසා සිටින බවත් එසේ සිටීම පුරවැසියෙකු වශයෙන් නොකළ යුතු බවට ආදර්ශයක් ලබාදීම මෙම ලිඛිත සැළ කිරීම මගින් සිදු කරන බවත් ය.

තවද සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂකගේ අංක 04/2017 හා 2017/06/19 දිනැති චක්‍රලේඛය අනුව දක්වා තිබු සුදුසුකම් වලට අනුව තමා අගහිග කලාකරුවෙකු ලෙස ලියාපදිංචි වී සිටින බවත්, එකී කරුණ හෝ අගහිග කලාකරුවෙකු වීමට ඇති සුදුසුකම් පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබීම අදාළ නොවන බවත් මන්ද ඒ සුදුසුකම් තමා විසින් සපුරා වසර කිහිපයක සිට ආධාර මුදල් ලබන බැවින් එකී ලිපිය මගින් කොරෝනා මත ලබාදුන් පන්දහස ලබා ගැනීමට තමාහට පනවා ඇති නීතිමය බාධාව හෝ අවහිරය පෙන්වා දෙනු වෙනුවට එකී ලිපිය විස්තර කර දැක්වීම නිශ්ඵල බවත් තමා හට හිමි අගහිග කලාකරු දිමනාව වර්ශයේ ඕනෑම මාසයක ලබාදිය හැකි බවත් එය අප්‍රේල් මාසයද විය හැකි බවත් තමාට මීට පෙරද විවිධ මාස වල ගෙවා ඇති බවත් එය විශේෂයක් නොවන බවත් එසේ වූවද එය ගෙවන්නේ අගහිග කලකරු ආධාර මුදලක් ලෙසින් මිස කොරෝනා වසංගත තත්ත්වය මත රජයෙන් ලබාදුන් සහන මුදලක් ලෙස නොවන බවත් කොරෝනා තිබුනද නොතිබුනද අගහිග කලාකරු ආධාරය ලබාදීම සිදු වන බවත් ඒ අනුව කලාකරු ආධාරය කොරෝනා සහනයන් සමඟ පටලවාගෙන ඇති බවත් එය බරපතල වරද්දා

ගැනීමක් බවත් කොරෝනා තත්ත්වය මත නිකුත් කළ ගරු අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ලිපිය හැර වෙන කිසිදු ලියවිල්ලක් අදාළ නොවන බවත් මන්ද අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ චක්‍රලේඛන වලට ඉහළින් කටයුතු කිරීමට කවර හෝ නිලධාරියෙකුට බලයක් නොමැති බවත් සඳහන් කර ඇත.

2020.05.14 වන දින තමා බදුල්ල දිස්ත්‍රික් ලේකම්තුමිය වෙත යොමු කරන ලද ලිපියේ තමා අගහිග කලාකරු ආධාරය ලබන අයෙක් බවත් ඒ හේතුවෙන් තමා හට කොරෝනා තත්ත්වය මත රජයෙන් ලබා දුන් රුපියල් පන්දාහසේ වාරික එකක්වත් ලබා දී නොමැති බවත් එය ලබාදීමට කටයුතු සලසා දෙන ලෙසටත් පැහැදිලිව සඳහන් කර තිබූ බවත් BD/DCD/10/3/8 හා 2020.04.20 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම්තුමිය අගහිග කලාකරු ආධාරය ලබන අයට පන්දහසේ දීමනාව නොගෙවන ලෙසට උපදෙස් දී තිබුනේ නම්, එය තමා ඉදිරිපත් කළ ලිපියට එකී කරුණු සඳහන් කර සෘජු පිළිතුරක් තමා වෙත ලබා දීමට හැකියාව තිබියදීත් ඇය එදිනම එනම් 2020.05.14 වැනි දින බදුල්ල ප්‍රාදේශිය ලේකම්තුමාට එස්.එච් සුමතිපාලට "සහනයක් ලබා දීමට හැකියාවක් ඇත්ද නැද්ද යන්න සොයා බලා ගත් ක්‍රියාමාර්ග දන්වන්න" යනුවෙන් , ලිපියක් යොමුකර ඇති බවත් දක්වා ඇත. එහි පිටපතක් තමා හටද ලබා දී තිබුනේ කුමන හේතුවක් නිසා දැයි පැහැදිලි කළ යුතුව ඇති බවත් එපමණක් ද නොව 2020.05.27 වැනි දිනැති තමාගේ අංක BD/EHM/COV/2/3 අංක දරණ බදුල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමාගේ අත්සනින් තමා වෙත යොමු කර තිබූ ලිපියේ බදුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් කරුණු විමසීමේදී හිගුරුගමුව වසමේ ග්‍රාමීය කමිටුවේ නිර්දේශය ලැබී නොමැති බව දන්වා ඇති බවත් ඒ අනුව 'ඔබගේ ඉල්ලීම නැවතත් පරීක්ෂා කර බලා අදාල දීමනාව ලබා දීමට හැකියාවක් පවතින්නේ නම් ඒ සඳහා කටයුතු කරන මෙන්' බදුල්ල ප්‍රාදේශීය ලේකම්වරයාට දන්වා යවා ඇති බව සඳහන් කර තිබූ බවත් ඒ අනුව පැහැදිලි වන්නේ අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා විසින් අගහිග කලාකරුවන්ට මෙම පන්දහසේ මුදල් ලබා දීම සම්බන්ධව විරුද්ධත්වයක් දක්වා නොමැති බවට වන බවත් දක්වා ඇත. එසේ එකී මුදල නොගෙවීමට තිරණය ගෙන තිබුණේ නම් නැවත නැවතත් මෙවැනි ලිපි හුවමාරුවක් මඟින් තමා හට සහන සැලසීමට කටයුතු කරන්නේ නැති බවත් සෘජු ලෙසම තමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක් තිබූ බවත් දක්වා ඇත.

එසේම කොරෝනා තත්ත්වය මත ජනතාවට පන්දහසේ මුදල් ලබාදීම වෙනුවෙන් අග්‍රාමාත්‍ය ලේකම්තැනගේ අත්සනින් නිකුත් කරනු ලැබූ ලිපිවල ඇතුළත් කිසිදු වගන්තියක් වෙනස් කිරිමට සංශෝධනය කිරිමට හෝ අලුතින් එකතු කිරිමට කිසිදු රාජ්‍ය නිලධාරියෙකුට හැකියාවක් නොමැති බවත් එවැනි සංශෝධන එකතු කිරිමක් හෝ වෙනස් කිරිමක් යම් නිලධාරියෙකු විසින් කරනු ලබන්නේ නම් එය නීතිවිරෝධී බවත් මන්ද එවැනි බලයක් ඔවුන්ට පවරා නැති බවත් එසේ හෙයින් BD/DCO/10/3/8 හා 2020-04-20 දිනැති ලිපිය නීත්‍යානුකූල ලිපියක් නොවන බව සඳහන් කරන බවත් දක්වා ඇත. බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලනයට යටත් හාලි ඇල ප්‍රදේශයේ ලේකම් කාර්යාලය අගහිඟ කලාකරුවන්ට කොරෝනා පන්දහසේ මුදල ගෙවා ඇත්තේ නම් බදුල්ල දිස්ත්‍රික් ලේකම්තුමියගේ ලිපියේ වලංගුභාවය ප්‍රශ්න කරන බවත් ඒ බව තමාගේ පළමු විරෝධතා දැක්වීමේදී ඉතා පැහැදිලිව ලේඛණ සහිතව ඉදිරිපත් කර තිබියදිත් උවමනාවෙන්ම ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් තමා විරෝධතා

ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යැවූ ග්‍රාම නිලධාරියාගේ වාර්තා බවත් හිඟුරුගමුව වසමේ නිලධාරි හා සමෘධි සංවර්ධන නිලධාරීනි පුෂ්පලතා එදිරිසිංහ යන අයද අත්සන් තබා තිබූ බවත් දෙදෙනාම තම නමට යටින් 2020.05.14 වැනි දිනය පැහැදිලිව යොදා තිබූ බවත්

2020.05.14 දින තමන් බදුල්ල ප්‍රාදේශීය ලේකම්ට භාරදී තිබූ හිඟුරුගමුව ග්‍රාම නිලධාරි හා හිඟුරුගමුව දිවිනැගුම සංවර්ධන නිලධාරිනිය (සමෘධි සංවර්ධන නිලධාරීනි පුෂ්පලතා එදිරිසිංහ) තම අත්සනින් යොදන ලද වාර්තාවේ 2020.05.28 රැස් වූ හිඟුරුගමුව ග්‍රාම කමිටු වාර්තාවේ නිර්දේශයද ඇතුළත් කර තිබූ බැවින් තමා හට රුපියල් දසදහසක අගහිග කලාකරු දීමනාව ලැබී ඇති බැවින් දෙවන අවස්ථාවේ රුපියල් පන්දහසේ දීමනාව ඉල්ලා තිබූ අයදුම්පතද ප්‍රතික්ෂේප වූ බව එකී නිර්දේශ අතර තිබූ බවත් ඉන් ගම්‍ය වන්නේ පළමු අයදුම්පත මේ අයුරින් ප්‍රතික්ෂේප කර ඇති බවට වන බවත්ය.

වඩාත්ම මතු කළ යුතු කාරණය වන්නේ 2020.05.28 හිඟුරුගමුව ග්‍රාම කමිටුව රැසවී ගත් තීරණය 2020.05.14 වැනි දින ග්‍රාම නිලධාරී සහ හිඟුරුගමුව දිවිනැගුම සංවර්ධන නිලධාරිනි (සමෘධි සංවර්ධන නිලධාරීනි) අත්සන් තබා බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත යැවූ වාර්තාවට ඇතුලත් වූයේ කෙසේද යන්න බවත් එමෙන්ම කමිටු නිර්දේශයන් හා සාමාජිකයන් අත්සන් තැබූ නාම ලේඛනය සහිත ලියවිල්ලටද ග්‍රාම නිලධාරී තම අත්සන සමඟ දිනය 2020.05.14 ලෙස යොදා ඇති බවත් එකී ලේඛනයට දිවිනැගුම සංවර්ධන නිලධාරිනියද (සමෘධි සංවර්ධන නිලධාරීනි පුෂ්පලතා එදිරිසිංහ) අත්සන් තබා ඇති බවත් මේ අනුව සත්‍ය වශයෙන්ම තමාගේ අභියාචනය ඉදිරිපත් කළාද නැද්ද මෙම දිනයන්හිදී ග්‍රාම කමිටුව රැස් වුනාද නැද්ද ඉදිරිපත් කළ වාර්තාව ව්‍යාජ වාර්තාවක්ද ආදී ගැටලු රාශියක් මතු වී ඇති බවත් ඒ අනුව මෙම ලේඛන කූට ලේඛන ලෙසට දක්වන බවත් සඳහන් කර ඇත.

තවද 2020.06.12 වැනි දින තමා හට එක් පනස්දහසක මුදලක් සමෘධි සංවර්ධන නිලධාරීනිය ලබාදුන් පසු එදිනම බදුල්ල ප්‍රාදේශීය ලේකම් වරයාට ඒ බව දැනුම් දෙමින් ඊළඟ පන්දහසේ මුදලත් ලබාදෙන ලෙසට ලියාපදිංචි තැපැලෙන් ඉල්ලීමක් කරන ලද බවත් එසේ වුවද 2020.06.25 වැනි දින ප්‍රාදේශීය ලේකම්වරයා ඉදිරිපත් කර තිබූ වාර්තාවේ ඊළඟ පන්දහසක මුදල ලබාදිය නොහැකි බව හෝ ලබාදී ඇති පන්දහසේ මුදල වැරදීමකින් ගෙවා ඇති බව හෝ නැවත අයකර ගන්නා බව එහි සඳහන් කර නොතිබූ බවත් 2020.06.12 ලියාපදිංචි තැපැලෙන් තමා යොමු කළ ලිපිය නොදුටුවාසේ කරුණු දක්වා ඇති බවත් 2020.07.08 වැනි දින තමා ඉදිරිපත් කළ විරෝධතා වාර්තාවේ එක් පන්දහසක් ගෙවූ පසු ඊළඟ පන්දහස ලබාගැනීමට අනිවාරෙන් තමා හට අයිතියක් ඇති බවට අවධාරණ කල පසු මුල් පන්දහස වැරදීමකින් ලබාදුන් බවට උපායක් ලෙසට කල්පනාකර කරුණු දක්වා ඇති බවත් දක්වා ඇත. ප්‍රාදේශීය ලේකම්වරයා යටතේ රාජකාරී කටයුතුවල යෙදෙන නිලධාරිනිය සහ කොරෝනා තත්වය තුල ප්‍රාදේශීය ලේකම්ට ඇති වගකීම් අමතක කරමින් මුදල් ගෙවීමක් වැනි කරුණකදී වැරදීමක් ලෙසින් කරුණු දැක්වීමට ගොස් ඔහු තවදුරටත් වගකීම් රහිත අයෙකු ලෙස කටයුතු කර ඇති බැව් ඔහු විසින්ම සනාථ කර ඇති බවත් සඳහන් කර ඇත.

සමස්තයක් ලෙස ගෙන බැලීමේදී ග්‍රාම නිලධාරී තැන සමෘද්ධි සංවර්ධන නිලධාරී (පුශ්පලතා එදිරිසිංහ) , ප්‍රාදේශීය ලේකම්වරයා,දිස්ත්‍රික් ලේකම්තුමිය,අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා නීත්‍යානුකූල අයුරින් කටයුතු නොකිරිම හේතුවෙන් තමා වැනි වයස අවුරුදු 70 ඉක්මවූ වයෝවෘධ අයෙකුගේ මානව හිමිකම් උල්ලංඝය කිරිමක් පැහැදිලි ලෙසම සිදු කර ඇති බව පෙන්වා දෙන බවත් දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ වැඩිදුර කරුණු දැක්වීම :-

දිස්ත්‍රික් ලේකම් වෙනුවට දිස්ත්‍රික් ලේකම්ගේ අත්සනින් BD/DCO/10/03/08 හා 2020-04-20 දිනැති ලිපිය මඟින් අගහිග කලාකරු ආධාරය ලබන කලාකරුවන්ට කොරෝනා තත්ත්වය මත රජයෙන් ලබාදුන් රුපියල් පන්දහසෙ වාරික දෙක ලබානොදීමට උපදෙස් දී ඇති බවත් තමාගේ අභියාචනය තමා භාරදෙන්නේ 2020-04-18 වැනි දින බවත් එකී අභියාචනය තමා භාර දෙන්නේ ග්‍රාමනිලධාරී තැන රුපියල් පන්දහසේ මුල්වාරිකය ගෙවීම ප්‍රතික්ෂේප කළ නිසා බවත් බදුල්ල දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශය තුළම ඇති හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියලූම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් රුපියල් දසදහසක වාර්ෂික ආධාර ලබන අගහිග කලාකරුවන්ට කොරෝනා තත්වය යටතේරුපියල් පන්දහසේ වාරික දෙකම ගෙවීම තුළ හිඟුරුගමුව ග්‍රාමීය කමිටුවේ සභාපති ග්‍රාම නිලධාරීතැන, සමෘධි සංවර්ධන නිලධාරීනිය, බදුල්ල දිස්ත්‍රික් ලේකම්වරයා, අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයා , බදුල්ල දිස්ත්‍රික් ලේකම්වරිය ,තමා හට රුපියල් පන්දහසක එක් වාරිකයක් ලබා නොදීම තුලින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1), 12(2) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරිමක් බවත් දක්වවා ඇත.

එහිදී පැමිණිලි පාර්ශවය විසින් තම පැමිණිල්ල ඉදිරිපත් කරන අතර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් වසරකට දෙනු ලබන රුපියල් 10000දීමනාව හේතුවෙන් කොරෝනා සමයේ දෙනු ලැබූ 5000 දීමනාව දිය නොහැකි බවට ග්‍රාම නිලධාරීතුමා පැවසූ බවත් එසේ දන්වා ඇත්තේ ග්‍රාමීය කමිටුව ගත් තීරණයකට අනුව බවත් පැමිණිලි පාර්ශවය ප්‍රාදේශීය ලේකම්ට දිස්ත්‍රික් ලේකම්තුමියට ලිපි යැවූ බවත් එයින්ද සාධාරණයක් නොවූ බවත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර ග්‍රාම නිලධාරී- හිඟුරුගමුව වසම කරුණු දැක්වීම :-

වගඋත්තරකාර ග්‍රාම නිලධාරී- හිඟුරුගමුව වසම සඳහන් කර ඇත්තේ, ග්‍රාමීය කමිටුවක් මඟින් රු.5000 දීමනාව ගෙවීම කළයුතු බවට අදාළ නිර්දේශ කළ බවත් කොරෝනා රෝග ව්‍යාප්ත සමයේ මුල් අවස්ථාවේ අගහිග කලාකරු දීමනාව රු.10000 ලැබුණු බවත්, ඒ හේතුවෙන් රු.5000 දීමනාව නොදිය යුතු බවට ග්‍රාමීය කමිටුව තීරණය කල බවත් දෙවන අවස්ථාවේ ග්‍රාම නිලධාරීන් ගන්නා ලද වෘත්තීය ක්‍රියාමාර්ගයක හේතුවෙන් ගෙවීම් කටයුතු වලින් ඈත්වූ බවත් පැමිණිලි පාර්ශවයට පමණක් නොව අනෙකුත් පාර්ශවයන්ටද මොනයම් හෝ දීමනාවක් ලබනවා නම් රුපියල් 5000 දීමනාව නොදුන් බවත්

දක්වා ඇති අතර, රුපියල් පන්දහසේ දීමනාව ලබා නොදුන් ප්‍රතික්ෂේප වූ අයගේ නාමලේඛනයද හේතුන් සහිතව ඉදිරිපත් කර ඇත.

පැමිණිලිපාර්ශවය විසින් අනෙකුත් ප්‍රාදේශීය ලේකම්කාර්යාලයන්හි අගහිග කලාකරුවන් සඳහා රුපියල් 5000ක දීමනාව ලබාදුන් බවටද තොරතුරු ඉදිරිපත් කළ අතර (රුපියල් 10000 දීමනා සහිතව රුපියල් 5000 දීමනාව ලබාදුන් බවට තොරතුරු) හිඟුරුගමුව ග්‍රාම නිලධාරී වසමේ රුපියල් 5000 දීමනාව ප්‍රතිකෂේප වූ අයගේ නාම ලේඛනයද ඉදිරිපත් කර ඇත.

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමාජසේවා අංශ නිලධාරීගේ කරුණු ඉදිරිපත් කිරීම :-**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමාජසේවා අංශ නිලධාරී කරුණු ඉදිරිපත් කරමින් මහජන ආධාර හා ආබාධිත ආධාර ලබාදීමට ග්‍රාම නිලධාරී හරහා කොරෝනා රෝග ව්‍යප්ත සමයේ ක්‍රියාත්මක කිරිමට බලය ලබා දුන් බවත් ග්‍රාමීය කමිටු වලින් තොරතුරු ගෙන ඒ අනුව අනුමැතිය ලබා දුන් බවත් අවුරුදු 70ට වැඩි අයට දීමනාව ලබාදීමේදීත් ග්‍රාමීය කමිටු වලින් තොරතුරු ගෙන දීමනාව ලබාදිය යුතු බවට ප්‍රකාශ කරන ලද අතර වෙනත් කිසියම් හෝ දීමනාවක් ලබන පුද්ගලයෙකුට රුපියල් 5000 දීමනාව නොදිය යුතු බවත් 2017 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අගහිග කලාකරුවන් සඳහා දෙන (CD/03/05/01 පොදු 2013 චක්‍රලේඛය ඉදිරිපත් කරමින්) අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියකින්ද කලාකරු දීමනාව දුන් අයට රුපියල් පන්දහසේ දීමනාව නොදිය යුතු බවට ලිපියකින් දැන්වූ බවත් ප්‍රකාශ කර ඇත.

එහිදි බදුල්ල දිස්ත්‍රික්කයේ කලාකරුවන්ට ලබාදුන් 5000 දීමනා ලාභීන් පස්දෙනෙක් සිටින බව පැමිණිලි පාර්ශවය කරුණු දක්වා ඇති අතර, මොවුන් පස්දෙනාගෙන් නැවත එය අයකර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්තුමා විසින් දන්වා ඇති නමුත් කුමන පදනමකින් 5000 දීමනාව ලබා දුන්නේද යන්න ප්‍රකාශ කළ යුතු බව කොමිෂන් සභාවේ පරීක්ෂණයට සහභාගී වී ඇති සමාජසේවා අංශ නිලධාරී වෙත දැනුම් දීමේදී පාර්ශව තුනක් වෙත ලිපි නිකුත් කර ඇති බවත් පවසා ඇත.

එම ලිපි නිකුත් කරන ලද්දේ කවදාද යන වගත් ලබාදුන් දීමනාව නැවත අයකර ගත්තේද යනවගත් සවිස්තර තොරතුරු සහිතව සතියක කාලයක් ඇතුළත කොමිෂමට යොමු කරන ලෙස කරන වගඋත්තර පාර්ශවයට දන්වා ඇති අතර, එහිදි වගඋත්තර පාර්ශවය විසින් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛනයේත් ජනාධිපති කාර්යාලයෙන් නිකුත් කල චක්‍රලේඛනයේත් පිටපත් ලබා දී ඇත. එහි වැඩිහිටි සියවස් පූර්ණ වැඩිහිටි ආබාධිත හා වකුගඩු යන දීමනා වලට සුදුසුකම් ලබන පුදගලයන් සිටින පවුල් ඒකකයක් වුවද පවතින තත්ත්වය මත ජීවනෝපාය අහිමිවී ඇති බවට ග්‍රාමීය කමිටුව නිර්දේශ කරන්නේ නම් එම පවුල ඒකක සඳහා ද රුපියල් පනදහසේ දීමනාව ලැබීමට සුදුසු බව සඳහන් වන නිරික්ෂණය විය.

පසුව විමර්ශනයේදී දැනුම් දූන් තොරතුරු බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් පහත පරිදි ඉදිරිපත් කර ඇත.

| අනු අංක | අගහිග කලාකරු ආධාර ලාභියාගේ නම | සමෘද්ධි ප්‍රතිලාභ ගෙවා ඇත/නැත | වැරදීමකින් ගෙවා ඇති රු.5000 වාරික අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| 1 | ආර්.ඩී.සාදිරිස් මයා | සමෘද්ධි ප්‍රතිලාභය කාලාත්‍රයාට ගෙවා ඇත. | ආර්.ඩී.සාදිරිස් මයා දැනට බිරියගෙන් වෙන්ව ජීවත්වේ. ආර්.ඩී.සාදිරිස් මයා හා බිරිඳ ඡන්ද හිමි නාමලේඛනයේ ලිපින දෙකක් යටතේ ලියාපදිංචි කර ඇත. එම නිසා අයකිරීම් කටයුතු කර නැත. |
| 2 | යූ.එම්.විමලසේන මයා. | ඇත. | 2020.06.24 දිනැති ලිපියෙන් නැවත එම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.(ඇමුණුම 01) |
| 3 | ආර්.එම්.සුමනසේකර මයා | ඇත. | 2020.06.29 දිනැති ලිපියෙන් නැවත එම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.(ඇමුණුම 02) |
| 4 | ආර්.එම්.එස්.සී.රණසිංහ මයා | සමෘද්ධි ප්‍රතිලාභය කාලාත්‍රයාට ගෙවා ඇත. | 2020.06.24 දිනැති ලිපියෙන් නැවත එම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.(ඇමුණුම 03) |

එසේම 2020 වර්ෂය සඳහා රු.10000.00 ක අගහිග කලාකරු ආධාර මුදල ලබාගත් කලාකරුවන් එම දීමනාව සඳහා ඇතුළත් කර නොගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් එවන ලද අංක BD/DCO/10/3/8 හා 2020-04-20 දිනැති ලිපියේ පිටපතක්ද යොමු කරඇත.

එමෙන්ම අගහිග කලාකරු ආධාර මුදල් ලද අයට රුපියල්.5000 මුදල නැවත අයකර ගැනීමේ තොරතුරු ලේඛන හා 2020 වර්ෂය සඳහා රුපියල් 10000 ක අගහිග කලාකරු ආධාර මුදල ලබා ගත් කලාකරුවන් එම දීමනාවට රුපියල් 5000 සේ දීමනාව ඇතුළත්කර නොගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම් බදුල්ල විසින් නිකුත් කළ ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කර ඇත.

**ඒ අනුව පැමිණිල්ල විමර්ශනයේ අනාවරණය වී ඇති කරුණු සහ නිගමනය :-**

01. මෙම පැමිණිලි පාර්ශවය සෑම වසරකම අගහිග කලාකරු දීමනාව වන රුපියල් 10000.00 ක මුදල ලබා ගෙන ඇත.

02. මෙම පැමිණිලිකරුට කොරෝනා වසංගතය හේතුවෙන් රජය ලබාදෙන ආධාර මුදල් වන රුපියල් 10000.00 කොටස් දෙක බැගින් ලබාදී ඇතත්, මොහු මෙම පැමිණිල්ල ඉදිරිපත් කළ

පසුව රුපියල් 5000.00 දීමනාවද එක්වරක් ලබාදී ඇත. මෙම ආධාර දීමනා ලබා දීමට ග්‍රාමීය මට්ටමේ කමිටු පිහිටුවා ඔවුන්ගේ තීරණය මත ගෙවීම් කටයුතු සහ නම ඉවත් කිරීම් කටයුතුද සිදු වී ඇත. එය ග්‍රාම නිලධාරී වාර්ථාවේ තවදුරටත් තහවුරු වේ. පැමිණිලි පාර්ශවයට එම ආධාර මුදල ලබා ගැනීමට සුදුසුකම් තිබුනද හිතාමතා ඔහුට ලබාදීම කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇත. තවද සමෘද්ධි ලාභීන්ටද වැඩිහිටි දීමනාව ලබා ගන්නා අයටද මෙම මුදල් ආධාර මුදල් ලබා දී ඇත. එය ප්‍රාදේශීය ලේකම්ගේ ලිපි වලින් තහවුරු වේ.

03. පැමිණිලි පාර්ශවය තවදුරටත් පෙන්වා දී ඇත්තේ, වෙනත් පළාත් වලත් කලාකරු දීමනා ලබාගත් අයට මෙම ආධාර මුදල් ලබා දී ඇති බවයි. එය ඔහුගේ විරෝධතා වල හා ඇමුණුම් වල සනාථ කර ඇත.

04. අංක 78 ඊ,හිඟුරුගමුව වසම ග්‍රාම නිලධාරී විසින් කමිටුවෙන් දෙන ලද වාර්තාව නිසි ආකාරයෙන් පරිශීලනය නොකර කමිටු වාර්තාව පිළිගනිමින් සොයා බැලීමකින් තොරව මොහුට හිමි ආධාර මුදල කපාහැර ඇති බව පැහැදිලි වේ.

05. රුපියල් 10000.00ක ආධාර මුදලින් ගෙවනු ලැබූ රුපියල් 5000.00 මුදල අයකර ගන්නා බව ලිඛිතව ප්‍රාදේශීය ලේකම්, බදුල්ල විසින් සුමතිපාල මහතාට හා තවත් කිහිප දෙනෙකුට දැනුම්දී ඇතත්,මේ වන තෙක් එය අය කරගෙන නොමැති බවත්, පැහැදිලි වේ.

06 මෙම පැමිණිල්ල තුළින් පැහැදිලි වන්නේ පැමිණිලි පාර්ශවයට හිමිවිය යුතු රුපියල් 10000.00කින් හිඟ මුදල් රුපියල් 5000.00 ක්ද ලැබීමට සුදුසුකම් ඇති බවය. ඒ අනුව මේ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකරුට අහිමි වී ඇති හිමිවිය යුතු රු. 5000/- ක දීමනාව ගෙවීමට පියවර ගත යුතුය.

2023.07.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

රෝහිණී මාරසිංහ,
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
බදුල්ල.

B/